27 APR 2010
UNIVERSITY OF KELANIYA

එස්.එම්.එම්.එස්.එස්.මායාදුන්නේ

(සේපාලී මායාදුන්නේ)

දර්ශන විශාරද උපාධි පාඨමාලාව

2010 අප්‍රියෙල් මාසය

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 667 |
| වර්ග අංකය | |

කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාව

# සාරසංග්‍රහය

යක්ෂ සංකල්පය ලෝකය පුරා විවිධ සමාජයන්හි අද දක්වා ම පැතිරී පවතියි. බිය, සැකය, ශංකාව, කෝපය වැනි මනෝභාවයන් යක්ෂ සංකල්පය ලෙසින් හැඳින්වුණ ද මානවවිද්‍යාඥයන් සපුරා ම එකඟ නොවන මතවාදයන් රැසකට යක්ෂ සංකල්පය මූලික ව ඇත්තේ ය.

ලිංගිකත්වය යක්ෂ සංකල්පයේ මූලය වශයෙන් ඇතැම් මානවවිද්‍යාඥයන් සලකා ඇත. ඇතැම් විටෙක සංවර්ධනය නොවූ ආගම් පිළිබඳ හැඟීම බවට ද මතවාදයන් ඉදිරිපත් කර තිබේ. එමෙන් ම ඉර, හඳ, තාරකා, ගින්න, වර්ෂාව, සුළඟ වැනි ස්වභාවධර්මයේ විවිධ සංසිද්ධීන් අවබෝධ කර ගත නො හැකිවීම හේතුකොටගෙන යක්ෂ සංකල්පය බිහිවූ බවට ද, විශේෂිත ආධ්‍යාත්මික බලවේගයක් අයත් කරගත්තා වූ පුද්ගලයන් හැඳින්වීමට ගත් වෑයම ලෙසින් ද විවිධ මතිමතාන්තර ඇත. පෙරදිග මෙන් ම අපරදිග ද යක්ෂයා යනු කවරෙක් දැයි හැඳිනගැනීමේ වෑයමක බොහෝ විද්‍යාඥයන් අද දක්වා ම නිරත වනු පෙනෙයි. මානවවිද්‍යාඥයන්ගේ මෙවන් නිර්වචන ඔස්සේ යක්ෂ සංකල්පය හඳුනා ගැනීමට පළමු පරිච්ඡේදය වෙන් කෙළෙමි.

මධ්‍යතන යුගයේ දී යුරෝපීය ආගමික පරිසරය භෞතික ජීවිතයේ සුභසිද්ධියට වඩා මරණින් මතු ජීවිතය සඳහා සමාජය හුරුකරවීමේ පරමාර්ථයෙන් පමණක් ම හැඩගැසුණේ ය. මෙයට බොහෝවිට ම බලපෑවේ ආර්ථික, සමාජීය සහ සෞඛ්‍යය හේතූන් බෙහෙවින් පහත් මට්ටමක පැවැතීම ය. එහෙයින් ම රෝග උපද්‍රව පමණක් නොව තමන් වෙත එළැඹෙන සියලු ම පීඩනයන් ද යක්ෂයා විසින් සිදුකරනු ලබන්නේ යයි වූ විශ්වාසයේ එල්බෙන්නට සාමාන්‍ය ජනතාව පෙළැඹෙන්නට ඇත. මේ පිළිබඳ ව දෙවැනි පරිච්ඡේදයෙන් විග්‍රහ කිරීමට ද තැත් කෙරෙයි.

යක්ෂ සංකල්පය අපරදිග ජන සමාජයට බලපෑවේ යුරෝපීය සමාජයට ලෙසින් ම නොවේ. සංක්‍රමණිකයන් වූ ඉන්දු යුරෝපීය ජනකොටස් දේශීය ගෝත්‍රික ජනකාය අතර දී යක්ෂයන් ලෙසින් හැඳින්වුණේ ය. එහෙයින් ම ඔවුන්ගේ යක්ෂයා අනෙකුත්

සමාජවල මෙන් කෘෂ්ණ වර්ණ ද නො වූයේ ය. ශ්වේත වර්ණයෙන් ම දිස්වූයේ ය. වෛදික යුගයේ දී වඩාත් ඉක්මනින් දේවත්වය ආගම සමඟ සබැඳුණු හේතුවෙන් පහත් හෝ කෲර හෝ සංකල්පයක් බවට යක්ෂයා පත්වන්නට ඇත්තේ නිතැතින් ම ය. මහායාන බෞද්ධ මතවාදයන්ට ද උරා ගැනුණු මේ විශ්වාසයන් පිළිබඳ ව තුන් වැනි පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙළෙමි.

ප්‍රාග් ඓතිහාසික ශ්‍රී ලංකාවේ යක්ෂ සංකල්පය විවිධ මූලාශ්‍රයන් මඟින් පැහැදිලි වෙයි. මහින්දාගමනය තෙක් සංවිධිත නොවූ මෙරට ආගමික සමාජය තුළ කිනම් පසුබිමක් ඔස්සේ මෙකී සංකල්පයන් පැවැතුණේ දැයි විමසා බැලීමට පුරාතන සාහිත්‍යය සහ පුරාවිද්‍යාත්මක සාධක මඟින් සැපයෙන ආලෝකය ද ඉමහත් ය. ඒ පිළිබඳ ව සතර වැනි පරිච්ඡේදයෙන් විවරණය කෙළෙමි.

ශ්‍රී ලංකාවේ වර්තමාන ගැමි ජනතාව බෞද්ධ ඇදහීම්වලට සපුරා ම වෙනස් වන්නා වූ ඇදහීම් මාලාවකට ද යොමු වී හිඳින බව පෙනී යයි. යක්ෂයන් පිළිබඳ දිවයිනේ එක් එක් පළාත් ආශ්‍රිත ව පූජාවිධි, යාතුකර්ම, ඇදහීම් බොහොමයක් පර්යේෂණයට ලක්කිරීමෙන් මේ සියල්ලට මූලික වූ සංකල්පයන් හඳුනාගත හැකිවෙයි. එමෙන් ම ගැමි සංස්කෘතියට පදනම් වූ කවි, කෝල්මුර, ප්‍රස්තාව පිරුළු ජනකියමන්, ජන ප්‍රවාද ආදී විවිධ අංග පිරික්සා බැලීමෙන් ද සිංහල විශ්වාස පද්ධතියේ පැවැතෙන යක්ෂ සංකල්පය පර්යේෂණයට ලක්කළ හැකි ය. ඒ කාර්යය පස් වැනි පරිච්ඡේදයෙන් සිදු කෙළෙමි.

ශ්‍රී ලංකාවේ ආගමික සංස්කෘතිය සමඟ යක්ෂ සංකල්පය ද නිරන්තරයෙන් ම සබැඳෙන්නේ ය. විශේෂයෙන් ම සිංහල යක්ෂ මණ්ඩලයට වඩා හාත්පසින් ම වෙනස් වූ බෞද්ධ යක්ෂ මණ්ඩලය අනුව ද ,බෞද්ධ සාහිත්‍යයේ මෙන් ම පරිත්‍රාණ දේශනාවල ද එන යක්ෂ සංකල්පය පිළිබඳ ව විමර්ශනය කිරීමට සය වැනි පරිච්ඡේදයෙන් වෑයම් කෙළෙමි.

එමෙන් ම යක්ෂ හා දේව ද්වි වේෂධර සංකල්පයක් ද දිවයිනේ බස්නාහිර පළාත ආශ්‍රිත ව පවතියි. වරෙක දේවත්වයෙන් ද වරෙක යක්ෂ ස්වරූපයෙන් ද ක්‍රියා කරන එක ම පුද්ගලයා පිළිබඳ මේ විශ්වාසයන් ද සිංහල විශ්වාස පද්ධතියේ

එන යක්ෂ සංකල්පය පිළිබඳ ව පැහැදිලි කිරීමේ දී වැදගත් වන බව ද පෙනෙයි. එහෙයින් සත් වැනි පරිච්ජේදයේ දී ඒ පිළිබඳ ව සාකච්ඡා කිරීමට ද වෑයම් කෙළෙමි.